# 05 සම්බුද්ධ පරිනිර්වාණය

පන්සාලිස් වසක් තිස්සේ මහාකරුණාවෙන් ලොවට දහම් මග පෙන්වා වදාළ අප ලොව්තුරා බුදුරජාණන් වහන්සේ බේලුව නම් ගමෙහි අවසන් වස් කාලය ගත කළ සේක. එකල්හි උන්වහන්සේට බලවත් වේදනා ගෙන දුන් ලෝහිත පක්ඛන්දිකා නම් රෝගය වැළඳිණි. අසීමිත චිත්ත ධෛර්යකින් එම වේදනාව යටපත් කර ගැනීමට උන් වහන්සේ සමත් වූ සේක. රෝගී තත්ත්වයෙන් බුදුරජාණන් වහන්සේ මිදුණු බව දැකීමෙන් ආනන්ද තෙරණුවන්ට ඉමහත් සැනසිල්ලක් ඇති විය. "ස්වාමීනි, ඔබ වහන්සේ ගිලන් බවින් මිදීම දුටු මා තුළ මහත් සතුටක් ඇති විය. ඔබ වහන්සේ රෝගාතුර වීම නිසා මගේ හිත ද දුර්වල විය. සිහිය උපදවා ගත නොහැකි තත්ත්වයට පත් විය. භාග්‍යවතුන් වහන්සේ භික්ෂු සංඝයාට කිසිවක් නොවදරා පිරිනිවන් නොපාන බවට මා තුළ විශ්වාසයක් ද ඇත." යනුවෙන් ආනන්ද මාහිමියෝ පැවසූහ.

එවිට බුදුරජාණන් වහන්සේ ආනන්ද හිමියන්ට පහත සඳහන් ප්‍රකාශය කළහ.

"ආනන්ද, භික්ෂු සංඝයා මගෙන් බලාපොරොත්තු වන්නේ කුමක් ද? ම විසින් නොසඟවා ධර්මය දේශනා කරන ලදි. මා වෙත ගුරු මුෂ්ටියක් තබා ගෙන නැත."

" ආනන්ද, මම භික්ෂු සංඝයා පාලනය කරමි යි කියා හෝ භික්ෂු සංඝයා මා උදෙසා ජීවත් වෙත්වා යි කියා හෝ අදහසක් මා තුළ නැත. ඒ නිසා ආනන්ද භික්ෂු සංඝයා අරබයා විශේෂයෙන් කුමක් කියන්න ද? ආනන්දය, මම දැන් අසූ වයස් ඇත්තෙමි. දිරාපත් වූ ගැලක් උණ පතුරු ආදියෙන් සකසා පවතින්නේ යම් සේ ද, මගේ ශරීරය ද එසේ පවතියි. එබැවින් ආනන්ද, තමාට තමා ම පිහිට කොට ධර්මය ම සරණ කොට වාසය කරන්න."

බුදුරජාණන් වහන්සේ, ආනන්ද තෙරණුවන්ට එසේ දේශනා කෙළේ තමාගේ විමුක්තිය තමා ම සලසා ගත යුතු ය යන අවවාදය සියලු ම භික්ෂූන් වහන්සේලාට ලබා දෙමිනි.

වස් කාලයෙන් අනතුරුව තමා ඇසුරු කළ ශ්‍රාවකයන් හා දායක පිරිස් අවසන් වරටත් දැක ගැනීමට බුදුරජාණන් වහන්සේ තුළ කැමැත්තක් ඇති විය. සැවැත් නුවරට වැඩම කළ උන් වහන්සේ මඳ කලක් එහි වැඩ විසූහ. ඉන් අනතුරුව රජගහ නුවරට වැඩ ආපසු විශාලා මහනුවරට වැඩම කළහ. පිඬු සිඟා වැළඳීමෙන් පසු ආනන්ද තෙරණුවන් සමග චාපාල චෛත්‍ය නම් ස්ථානයට ළඟා වූ සේක. එහි දී ආනන්ද තෙරණුවන් අමතා මෙසේ වදාළ සේක.

" ආනන්දය, සතර ඍද්ධිපාද මැනවින් ප්‍රගුණ කළ කෙනකුට, කැමති නම් ආයු කල්පයක් හෝ ඊටත් වැඩියෙන් මඳ කාලයක් ජීවත් විය හැකි ය. තථාගතයන් වහන්සේ සතර ඍද්ධිපාද වඩා ඇති හෙයින් ඒ සඳහා සමත් වන සේක."

ආයු කල්පය නම් ඒ කාලයේ පරමායුෂයි. එහෙත් අනඳ හිමිට බුදුරදුන් කළ ප්‍රකාශය ගැන එතරම් වැටහීමක් ඇති නො විණි. එබැවින් උන් වහන්සේ කල්පයක් හෝ ඊට වැඩි කාලයක් වැඩ සිටින ලෙස බුදුරදුන්ට ආරාධනා නො කළහ. ඉන් පසු බුදුරජාණන් වහන්සේ තව තුන් මසකින් පිරිනිවන් පෑමට අදිටන් කළහ. එය ආයු සංස්කාරය අත් හැරීම ලෙස හැඳින්වේ. පිරිනිවන් පෑමට අදිටන් කළ බව බුදුරදුන්ගෙන් දැනගත් ආනන්ද හිමියෝ බලවත් කම්පාවට පත් වූහ. කල්පයක් ජීවත් වන ලෙස තෙවතාවක් ම බුදුරදුන්ගෙන් කළ ඉල්ලීම උන්වහන්සේ ප්‍රතික්ෂේප කළහ.

" ආනන්දය, දැන් එසේ ඉල්ලීමට සුදුසු වේලාව නො වේ" යැයි බුදුරජාණන් වහන්සේ වදළ සේක.

බුදුරජාණන් වහන්සේ සම්බුද්ධ පරිනිර්වාණය දැනුම් දීම සඳහා ආනන්ද හිමියන් ලවා විසාලා මහනුවර කූටාගාර ශාලාවට භික්ෂූන් වහන්සේලා කැඳවූහ.

"මහණෙනි, මා අවබෝධ කොට ගෙන දෙසූ ධර්මය මැනවින් ඉගෙන ලෝකයාගේ හිත සුව පිණිස, බුද්ධ ශාසනයේ චිරස්ථිතිය පිණිස, කටයුතු කරන්න. මහණෙනි, තථාගතයන් වහන්සේ තව තුන් මසකින් පිරිනිවන් පානා සේක. සියලු සංස්කාර ධර්ම නැසෙන සුලු ය. නොපමා ව කුසල් දහම් සම්පාදනය කරන්න."

යනුවෙන් ප්‍රකාශ කළ සේක. ඒ ඇසූ රහතන් වහන්සේලා බලවත් සංවේගයට පත් වූහ. රහත් නොවූ භික්ෂූන් වහන්සේලා මහත් සේ ශෝකයෙන් ඒ පිළිබඳ ව කතා කරමින් කල් ගත කළහ.

ධර්මාරාම හිමියෝ අනෙක් පිරිසෙන් ඈත් ව හුදෙකලාව භාවනා කිරීමෙහි යෙදී සිටියහ. උන් වහන්සේ එසේ කළේ තථාගත පරිනිර්වාණය පිළිබඳ කණගාටුවක් නැති නිසා නො ව සම්බුද්ධ පරිනිර්වාණයට පෙර තමා රහත් බව ලැබීමට අධිෂ්ඨාන කොටගෙන සිටි බැවිනි. එම උත්සාහය අගය කළ බුදුරජාණන් වහන්සේ මෙසේ වදළහ.

" මහණෙනි, යම් භික්ෂුවක් මා අනුව යන්නේ නම්, ඒ තෙම ධර්මාරාම භික්ෂු නම මෙන් විය යුතු ය. මල් සුවඳ ආදියෙන් මා පුදන්නෝ නිසි ලෙස මා පුදන්නෝ නො වෙති. ධර්මානුකූල පිළිවෙත් පුරන අය ම මා පුදන්නෝ වෙති."

ඒ අනුව ආමිස පූජාවට වඩා ප්‍රතිපත්ති පූජාව වැදගත් බව ද පෙන්වා දෙන ලදි.

විසාලා මහනුවරින් නික්මෙන බුදුරජාණන් වහන්සේ " ආනන්දය, මා විසාලා මහනුවර දකින අවසාන අවස්ථාව මේ" යැයි පවසමින් එදෙස නැවත හැරී බැලූ සේක. ඉන් අනතුරුව භණ්ඩගාම, හත්ථිගාම, අම්බගාම, ජම්බුගාම යන ගම් පසු කර භෝග නගරයට වැඩම කළ සේක. එහි දී ධර්ම විනය නිවැරදි ව අවබෝධ කර ගැනීම සඳහා සතර මහෝපදේශ දේශනා කළහ. යමක් බුද්ධ වචනයක් ද නැත්දැයි තීරණය කර ගැනීම පිණිස අනුගමනය කළ යුතු පිළිවෙත එයින් ප්‍රකාශ විය.

භෝග නගරයෙන් නික්මුණු බුදුරජාණන් වහන්සේ පාවා නුවරට වැඩම කර, එහි චුන්ද නම් කර්මාර පුත්‍රයාගේ අඹ උයනෙහි වැඩ විසූහ. උන් වහන්සේ දැකීමට ගිය චුන්ද බණ අසා පැහැදී, පසු දින බුදු පාමොක් මහ සඟනට දනට ආරාධනා කෙළේ ය. එදින දනයට "සූකර මද්දවය" නම් විශේෂ ආහාරයක් ද විය. බුදුරදුන්ට චුන්ද කර්මාර පුත්‍රයාගේ එම දනය වැළඳීමෙන් පසු මුලින් පැවති ලෝහිත පක්ඛන්දිකා රෝගය යළිත් උත්සන්න විය. මෙම රෝගය නිසා හටගත් බලවත් වේදනාව ද බුදුරජාණන් වහන්සේ මනා සිහියෙන් යුතු ව ඉවසූ සේක. එම වේදනාව අන් අයට නොහැඟෙන පරිදි ම ඉවසූ සේක.

පාවා නුවරින් නික්ම කුසිනාරාව බලා වඩින බුදුරජාණන් වහන්සේට අතර මගදී මහත් වෙහෙසක් දැනිණි. ක්ලාන්ත ගතියක් ඇති විය. බලවත් පිපාසයක් ද දැනිණි. "ආනන්දය, මට පිපාසයි. පැන් ටිකක් සොයා ගෙනෙන්නැ" යි වදරා සඟළ සිවුර සතරට නමා බිම එළා වැඩ හිඳ අනඳ තෙරුන් ලවා අසල කුඩා නදියකින් පැන් ගෙන්වා ගෙන වැළඳූ සේක. අනතුරුව මාර්ගය අසල ම වූ ගසක් මුල විවේක ගත්හ. එවේලෙහි පුක්කුසාති නම් මල්ල පුත්‍රයා එතැනින් යමින් සිටියේ ය. ආලාරකාලාම තවුසාණන්ගේ අනුගාමිකයකු වූ හෙතෙම බුදුරජාණන් වහන්සේ දැක ධර්ම සාකච්ඡාවක ද යෙදුණේ ය. හෙතෙම බණ අසා බොහෝ සේ සතුටු ව, බුදුරදුන් කෙරෙහි බෙහෙවින් පැහැදී තෙරුවන් සරණ ගොස්, අගනා සිවුරු පිළි දෙකක් උන් වහන්සේට පිදී ය. අනඳ තෙරණුවෝ එම පැහැපත් සිවුරක් බුදුරජාණන් වහන්සේට පෙරවූහ.

ඉන් අනතුරු ව බුදුරජාණන් වහන්සේ භික්ෂු සංඝයා ද සමගින් එතැනින් පිටත් ව කකුද නම් නදිය වෙතට වැඩම කළහ. එම නදියෙන් පැන් වළඳා, ශරීරය ධෝවනය කොට අසල වූ අඹ වනයට වැඩම කළ උන් වහන්සේට යළිත් තද ක්ලාන්ත ගතියක් ඇති වී සඟළ සිවුර බිම අතුරා අසුනක් පිළියෙල කර එහි සැතපුණු සේක. තම දනය

නිසා බුදුරජාණන් වහන්සේ රෝගාතුර වූ සේකැයි චුන්ද කර්මාර පුත්‍රයාට යම් පසුතැවිල්ලක් ඇති වුවහොත් ඔහුට කරුණු කියා දී සිත සනසන ලෙසට ආනන්ද හිමිට පැවසූ සේක. බුදු වීමට ප්‍රථම සුජාතාව දුන් දනයත්, පරිනිර්වාණයට පෙර චුන්ද දුන් දනයත් සමාන ආනිසංස ඇති බව පැහැදිලි කරන ලෙස ද වදළහ.

හිරණ්‍යවතී නදියෙන් එතෙර වූ බුදුරජාණන් වහන්සේ කුසිනාරාවේ උපවර්තන නම් සල් උයනට වැඩම කොට අනඳ තෙරණුවන් ලවා සල් ගස් දෙකක් අතර අසුනක් පිළියෙල කරවා ගෙන එහි උතුරට හිස ලා සැතපුණු සේක. තථාගතයන් වහන්සේගේ පිරිනිවන් පෑම ගැන සිතූ පෘථග්ජන භික්ෂූහු, මහත් සේ ශෝකයට පත් ව හැඬූහ. වැළපුණහ. උපවර්තන සල් උයන ද අකල්හි පිපුණු මලින් පිරී ගියේ ය. මල් රේණු මල් පෙති බුදුරජාණන් වහන්සේට පූජා පිණිස මෙන් බුදුරජාණන් වහන්සේගේ සිරුර මත වැටෙයි. මෙහි දී සංවේගයට හා ශෝකයට පත් භික්ෂූන් වහන්සේලා ඇමතූ බුදු රජාණන් වහන්සේ තථාගත පරිනිර්වාණයෙන් පසු දැක සංවේග උපදවා ගැනීමට සුදුසු ස්ථාන සතරක් ගැන සඳහන් කළහ. එනම් බුදුරජාණන් වහන්සේ සිදුහත් කුමරුන් ව උපන් තැන, බුදු වූ තැන, දම්සක් පැවැත්වූ තැන හා පිරිනිවන් පෑ තැන ය.



**සම්බුද්ධ පරිනිර්වාණය**

සම්බුද්ධ පරිනිර්වාණය ආසන්න වෙමින් පැවතිණි. ආනන්ද තෙරණුවන්ට දරා ගත නොහැකි ශෝකයක් දැනිණි. " සැම ද ම මා කෙරෙහි අනුකම්පාව දැක්වූ බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පාන සේක. දැන් මට කාගේ පිහිටක් ද?" යි සිතමින් මහත් සේ හැඬූ හ. ඒ බව දැනගත් බුදුරජාණන් වහන්සේ අනඳ තෙරුන් කැඳවා සිත සැනසූහ. ජීවිතයේ අනිත්‍යතාව වටහා දෙමින්, ඉතා හොඳින් බුද්ධ උපස්ථානය කළ ආකාරය අගය කළහ. උත්සාහවන්ත ව ක්‍රියා කිරීමෙන් ඉතා ඉක්මනින් ම රහත්විය හැකි බව ද වදළහ. අනෙක් භික්ෂූන් වහන්සේලාට ද අනඳ හිමිගේ ගුණ පැහැදිලි කර දුන්හ.

එදින රාත්‍රියෙහි බුදුරජාණන් වහන්සේ පිරිනිවන් පාන බව අනඳ හිමියන් මල්ල රජ දරුවන්ට දනුම් දුන් අතර, ඔවුහු පැමිණ බුදුරදුන් අවසන් වරට දක වන්දනා කර ගත්හ. මේ අවස්ථාවේ දී සුභද්ද නම් පිරිවැජියා තම සැක දුරු කර ගැනීම සඳහා ප්‍රශ්න කිහිපයක් ඇසීමට අවසර ඉල්ලී ය. ආනන්ද තෙරණුවෝ එම ඉල්ලීම ප්‍රතික්ෂේප කළහ. මේ කතා බහ අසා සිටි බුදුරජාණන් වහන්සේ මෙසේ වදාළහ.

> " ආනන්ද, සුභද්දට මා වෙත එන්න ඉඩ දෙන්න. ඔහු මා වෙත පැමිණියේ මා වෙහෙසට පත් කරන්නට නො වේ. මගෙන් කරුණු විමසා සැක දුරු කර ගැනීම පිණිසයි."

එහි දී ඔහුට පිළිතුරු ලෙස දෙසූ බණ අසා පැවිදි ව රහත් වූ අතර බුදුරදුන් වැඩ සිටියදී පැවිදි වූ අන්තිම ශ්‍රාවකයා වූයේ ඒ සුභද්‍ර රහතන් වහන්සේ ය.

"මහණෙනි, රත්නත්‍රය පිළිබඳ ව යම් සැකයක් හෝ විමතියක් හෝ ඇතොත් දැන් ම විචාරා දැන ගන්න. පසුව පසුතැවිලි නො වන්න" යි බුදුරජාණන් වහන්සේ වදාළහ. "තමන් වහන්සේ කෙරෙහි ගෞරවයෙන් ප්‍රශ්න නොනගන්නේ නම් යහළුවකු මගින්වත් සැක මුසු තැන් ගැන විමසන්න" යැයි වදාළහ. එහෙත් කිසිවෙක් ප්‍රශ්න නොනැගූහ. අවසානයේ බුදුරජාණන් වහන්සේ මෙසේ වදාළහ.

> **"හන්දදානි භික්ඛවේ ආමන්තයාමි වෝ වයධම්මා සංඛාරා, අප්පමාදේන සම්පාදේථ"**
>
> "මහණෙනි, මම දැන් ඔබ අමතමි. සියලු සංස්කාර නැසෙන සුලු ය. නොපමා ව කුසල් දහම්හි යෙදෙන්න."
>
> **(මහාපරිනිබ්බාන සූත්‍රය)**

මේ අන්තිම බුද්ධ වචනයයි.

බුදුරජාණන් වහන්සේ ඒ වෙසක් පුන් පොහෝ දින පශ්චිම යාමයේ දී පිරිනිවන් පා වදාළහ. උපවර්තන සල් උයන අපමණ ශෝකයෙන් ඇළලී ගියේ ය. සල් මල් බුදු සිරුර මත පතිත වූයේ පරිසරය ම සුගන්ධවත් කරමිනි. රහත් නො වූ භික්ෂූන් වහන්සේලා එදෙස බලා සිටියේ අපමණ ශෝකයෙනි. රහතුන් වහන්සේලා සංස්කාර ධර්මයන්ගේ ස්වභාවය මෙනෙහි කරමින් නිසල ව බලා හුන්හ. අප බුදුරජාණන් වහන්සේ අනුපාදිසේස පරිනිර්වාණ ධාතුවෙන් පිරිනිවන් පෑ සැණින් මහ පොළොව කම්පා වූයේ තථාගත පරිනිර්වාණය මුළු ලොවට ම දනුම් දීමට මෙනි.

මල්ල රජ දරුවෝ පිරිනිවන් පෑ බුදු සිරුරට සුවඳ මල් පැන් ආදියෙන් සත් දිනක් ම පූජෝපහාර දක්වූහ. සක්විති රජකු ආදහනය කිරීමේ දී කෙරෙන සියලු චාරිත්‍රවාරිත්‍ර ඇතිව බුදු සිරුර පිළිබඳ ආදහන කටයුතු සංවිධානය විය. දේහය අලුත් පිළියෙන් හා කපු පුළුනෙන් වෙලා රන් දෙණක තැන්පත් කරන ලදි. මකුට බන්ධන නම් ස්ථානයෙහි සඳුන් දරවලින් තැනූ සෑයකට නංවා තථාගත දේහය ආදහනය කරන ලදි. තුන්ලොව ම එළිය කළ ප්‍රඥා ප්‍රදීපය වසර දහස් ගණනක් පුරා පැතිර යන ආලෝකයක් ඉතිරි කරමින් නිවී ගියේ එලෙසිනි.

## සාරාංශය

කුසිනාරාවේ උපවර්තන සල් උයනේ දී සම්බුද්ධ පරිනිර්වාණය සිදු විය. පරිනිර්වාණ සමයේ දී බුදුරජාණන් වහන්සේගේ චර්යාව ආදර්ශ සම්පන්න ය. අවසන් වස් කාලය බේලුව ගමෙහි වැඩ විසූ බුදුරජාණන් වහන්සේට දරුණු ලෝහිත පක්ඛන්දිකා රෝගය හට ගැනිණි. උන් වහන්සේ විසාලා මහනුවර කූටාගාර ශාලාවේ දී සම්බුද්ධ පරිනිර්වාණය පිළිබඳ ව භික්ෂූන් වහන්සේලාට දැනුම් දුන්හ. චුන්ද කර්මාරගේ සූකර මද්දව දනය වැළඳීම, පුක්කුස මල්ල පුත්‍රයාට දහම් දෙසීම, සුභද්‍ර පිරිවැජියාගේ පැවිදි වීම ආදී වැදගත් සිදු වීම් රැසක් මේ සමයේ දී සිදු විය. කුසිනාරාවේ උපවර්තන සල් උයනේ දී සම්බුද්ධ පරිනිර්වාණය සිදු වූයේ සියලු සක්වල කම්පා කරවමිනි.

## ක්‍රියාකාරකම්.

01. සැදැහැතියකු විසින් දැක සංවේගය උපදවා ගත යුතු ස්ථාන හතර කවරේ ද?

02. සම්බුද්ධ පරිනිර්වාණ සමයේ සිදු වීම් ඇසුරෙන් බුද්ධ චරිතයෙන් ගත හැකි ආදර්ශ හතරක් සොයා ලියන්න.

03. උපවර්තන සල් උයනේ දී සිදු වූ සම්බුද්ධ පරිනිර්වාණය චිත්‍රයකට නගන්න.

## පැවරුම

"අසිරිමත් බුදු කුසුම පරවිණි" යන තේමාව යටතේ පද්‍ය පන්තියක් නිර්මාණය කර සාමූහික ව ගායනා කරන්න.